# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2360/65 – 2023 දෙසැම්බර් මස 01 වැනි සිකුරාදා – 2023.12.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/149.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.09 දිනැති හා අංක 2314/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නාවලපිටිය, මල්ලන්ද, ඩී2, හි පදිංචි සී. ජී. එස්. ගුණසේකර මයා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 05/2023 හා 2023.11.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 040892 – 24 (2023/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය: A/05/2023.
IR/COM/01/2020/149.

සී. ජී. එස්. ගුණසේකර මයා,
ඩී2,
මල්ලන්ද,
නාවලපිටිය.

*පළමු පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන වන මා පත්කොට මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීමට පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණු වනුයේ,

'' ලංකා විදුලි බල මණ්ඩලයේ සේවයේ නියුතු සී. ජී. එස්. ගුණසේකර මහතාට ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනාධිකාරියේ යම් කිරීමක් හෝ නොකර හැරීමක් මත විදුලි ඉංජිනේරු II පංතිය I ශ්‍රේණියට පත් කිරීමේ දී අසාධාරණයක් සිදු ව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ. ''

ඒ අනුව පැමිණිලිකාර සී. ජී. එස්. ගුණසේකර මහතාට ලැබුණු මෙහි ලේඛන ගත කර ඇති P1 යන ලිපියට අදාළව කරුණු ඔහු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දිය යුතු දිනය වන 1997 ක් වූ ඔක්තෝබර් මස 21 යන දිනය එහි දක්වා ඇතත් එකී කැඳවීමේ ලිපිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත) වෙත ලැබුණු දිනය 1997 ක් වූ ඔක්තෝබර් මස 22 වැනි දිනය ලෙසට මුද්‍රාව සහ අත්සන් තබා තිබීම එම ලිපිය සම්මුඛ පරීක්ෂණය කැඳවීමේ දිනය වන 1997 ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දිනෙන් පසුව පැමිණිලිකාර ගුණසේකර මහතා වෙත ලබා දී ඇති බව මෙයින් තහවුරු වේ. එය අතපසු වීමක් හෝ හිතාමතාම කළහැක්කක් බව තහවුරු වේ. එසේ අතපසු වූ බව වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි විමසීමේ දී තහවුරු විය. ඒ අනුව පැමිණිලිකාර සී. ජී. එස්. ගුණසේකර මහතාට අසාධාරණයක් සිදුව ඇති බව බේරුම්කරණය නිගමනය කරයි. එම කටයුතු සලකා බැලීමෙන් අනතුරුව සී. ජී. එස්. ගුණසේකර මහතාට හිමිවන්නට තිබූ විදුලි ඉංජිනේරු II පංතිය I ශ්‍රේණියට පත් කිරීමේදී අසාධාරණයක් සිදුව තිබේ. ඒ අනුව ඔහුට අදාළ දිනයේ සිට සේවයේ පිහිටුවූයේ නම් පහත සඳහන් ප්‍රතිලාභ ලැබිය යුතුව ඇත.

සී. ජී. එස්. ගුණසේකර මහතා ඉල්ලීම් කර ඇති අනෙකුත් සහන ලබා දීමට මෙම අධිකරණයට බලයක් නොමැති අතර ඒවා ලබා ගැනීමට (උදාහරණ කම්කරු අයිතීන්) නම් මෙම නඩු තීන්දුව උපයෝගී කොට ගෙන දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හරහා සේවක භාරකාර සහ පාරිතෝෂිත සහ ඔහු ඉල්ලා සිටින අනෙකුත් දීමනා ලබා ගත යුතුය. ඒ සඳහා මෙම නඩු තීන්දුව පාදක කොට ගත හැක. කෙසේ වෙතත් සී. ජී. එස්. ගුණසේකර මහතා 13.01.2023 දාතමින් යුතු ඔහුට අහිමි වූ මුදල් සහ දීමනා පිළිබඳව ලිපියේ අඩංගු පරිදි වාර්ෂික පඩි වැඩි වීම් සහ දීමනා ඔහුට අහිමිව ඇත. එම විස්තරයට අදාළ ලේඛනය ඒ/05/2023, 2023/11/03 යටතේ අමුණා ඇත.

සී. ජී. එස්. ගුණසේකර මහතා සේවයේ පිහිටුවිය යුතු දවස 1997 අගෝස්තු 21 දිනය සේ සලකා ඔහු එම තනතුරේ නැවත පිහිටුවූ 1998 දෙසැම්බර් දක්වා ඔහුට හිමිවීමට තිබූ මුදල වන රුපියල් 328, 690.00 (තුන් ලක්ෂ විසි අටදහස් හයසිය අනූව) මුදල මෙම ප්‍රදානය ගැසට් ගත කිරීමේ දින සිට දින 30 ක කාලයක් තුළ සහකාර කම්කරු කොමසාරිස් දකුණු කොළඹ කාර්යාලය වෙත තැන්පත් කරන ලෙස පළමු වගඋත්තරකරුට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන,
බේරුම්කරු

03 NOV 2023

**Financial Loss due to loss of seniority CRS Gunasekara**
Due date of Promotion : 10 July 2 2021
SALARY

| | before 10 July (E1 Scale) | If promoted to (E special) Scale | Difference in initial salary | Increase due to Increment | | EPF |
|---|---|---|---|---|---|---|
| Aug-21 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | 1st increment | 3,730.00 |
| Sep-21 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Oct-21 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Nov-21 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Dec-21 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Jan-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Feb-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Mar-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Apr-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| May-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Jun-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Jul-22 | 371,125.00 | 374,405.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Aug-22 | 374,405.00 | 386,045.00 | 3,280.00 | 23,280.00 | 2nd increment | 3,730.00 |
| Sep-22 | 374,405.00 | 386,045.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Oct-22 | 374,405.00 | 386,045.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Nov-22 | 374,405.00 | 386,045.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| Dec-22 | 374,405.00 | 386,045.00 | 3,280.00 | 11,640.00 | | 3,730.00 |
| | | | | | | 63,410.00 |
| | Total | | 55,760.00 | 209,520.00 | | 265,280.00 |
| Gratuity | basic salary | 17 * 11640 | | 197880 | | 197,880.00 |
| Remote allowance | | 130,680.00/4 | | 13,940.00 | | 13,540.00 |
| Generation allowance | | 130,680.00/3 | | 18,586.67 | | 18,586.67 |
| Professional allowance | | 65,000/5 | | 169,000.00 | | 160,000.00 |
| Post graduate allowance | | 65,000/5 | | 169,000.00 | | 169,000.00 |
| EPF | | | | 63,410.00 | | 63,410.00 |
| ETF | | | | 96,690 x 0.03 | | 1,992.30 |
| Exodus | | 3280x13x0.1 | | 4264 | | 4,264.00 |
| Financial loss up to 31 Dec 2022 | | | | | Rs | 986,672.97 |
| Loss of contribution to pension | | 11,640.00 x 2x0.34 | | per month | Rs | 7,915.20 |
| Loss of Pension contribution per year | | | | | Rs | 94,982.40 |

මගේ අංකය: IR/COM/03/2017/215.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.17 දිනැති හා අංක 2084/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.08.08 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 (වර්තමානයේ දෙහිවල, නගර සභා පටුමග, අංක 10)හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (එන්.ඒ. සහබන්දු මයා වෙනුවෙන්) සහ පිළියන්දල, ගෝනමඩිත්ත පාර, අංක 318හි පිහිටි ඇක්මි ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජිං පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 61/2018 හා 2023.10.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය : A/61/2018.
IR/COM/05/2017/215.

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 259/9, සෙත්සිරි මාවත,
කොස්වත්ත,
තලංගම (එන්.ඒ. සහබන්දු මයා වෙනුවෙන්).

*පළමු පාර්ශ්වය*

ඇක්මි ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජිං පී.එල්.සී.,
අංක 318, ගෝනමඩිත්ත පාර,
පිළියන්දල.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල සඳහා

ප්‍රදානය

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2018.08.08 මා පත්කරන ලදී. ඒ බව 2018.08.19 දින කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018.08.19 දිනැති ලිපියෙන් දන්වන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් මා වෙත යොමු කරන ලද ආරාවුල වන්නේ

"ඇක්මි ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් පී.එල්.සී. හි නිෂ්පාදන වැඩමූලික (Production foreman) ලෙස සේවය කළ එන්.ඒ. සහබන්දු මහතාට වයස අවුරුදු 60වන තෙක් එම ආයතනයේ සේවය කිරීමට අවස්ථාව ලබා නොදී වයස අවුරුදු 55 සම්පූර්ණ වූ 2017.11.17 දිනෙන් විශ්‍රාම ගැන්වීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයක් මොනවාද යන්න පිළිබඳ වේ".

පළමු හා දෙවන පාර්ශ්වයන් තමුන්ගේ දේශන සහ ප්‍රතිප්‍රකාශන ඉදිරිපත් කර එක් එක් පාර්ශ්වයන් අතර හුවමාරුකර ගත් පසු 2019.05.09 දින නඩුව ආරම්භ කරන ලදී. පැමිණිලිකරු වෙනුවෙන් නියෝජිත ලෙස සුජීව සුහසිංහ මහතා ද වගඋත්තර පාර්ශ්වය වෙනුවෙන් මානව සම්පත් කළමනාකරු නාලක පරණයාපා මහතා පැමිණි සිටි අතර නීතීඥ විජය හෙට්ටිආරච්චි මහතා පෙනී සිටින ලදී. පළමුව ඉල්ලුම්කාර එන්.ඒ. සහබන්දු මහතා සාක්ෂි දෙමින් ඔහු 1996 මාර්තු මස 16 දින ආයතනයට ස්ක්‍රීන් ඩිලර් ලෙස හඳුන්වන යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස පත්වීම් ලබා ඇත. 2004 පෙබරවාරි 27 දින (A2) ලිපියෙන් 2003 සැප්තැම්බර් 4 දින සිට වැඩමූලිකයකු ලෙස උසස් කර ඇත. එම තනතුරට පත්කළ අයකු අවුරුදු 60 දක්වා සේවය කරනවා ඉල්ලුම්කරුට පෙර සිටි සියලු වැඩමූලික වරුන් ද අවුරුදු 60 දක්වා සේවය කළ බවත් ඉල්ලුම්කරු විශ්‍රාම යවන (A5) බව දැන්වූ පසු ඒ 6 ලේඛනය මගින් 2017.10.09 දින ආයතනයේ මානව සම්පත් කළමනාකරුට දන්වා සිට ඇත්තේ තම තනතුරට අදාළ විශ්‍රාම ගැන්වීම් සිදුකරනුයේ අවු. 60 දී බව ආයතනයේ පවතින ක්‍රියා පටිපාටිය බැවින් විශ්‍රාම ගැන්වීමේ ලිපිය පිළිනොගන්නා බව දන්වා ඇත. තමාට පෙර සිටි සියලු වැඩමූලික ණයකරුවන්ට අවු 60 දක්වා සේවයට ඉඩදී ඇත. ටී.බී. එගොඩවත්ත (A12) උදාහරණයක් ලෙස පෙන්වා ඇත. එසේම බැංකුව මගින් ණය ලබාගැනීමට අවු. 60 දක්වා සේවය කළ හැකි බවට ගිණුම් අංශයේ A3, A4 ලිපි ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ දින මුද්‍රා සහ එම කාර්යාලයේ රබර් සීලය සහිතව ගිණුම් අංශයේ ෆරනාස් හසන් අය අත්සන් කර නිකුත් කර ඇත. එය ලබා ගත හැකි වන්නේ මානව සම්පත් අංශයට ලිපියක් දුන්විට එය මුදල් අංශයට යවා අත්සන් කර නැවත මානව සම්පත් අංශයට එවූ විට පිටපත් අත්සන් තබා ලබාගත් බව කියාසිටින ලදී. එම ලිපියේ "2022.11.27 වෙනකම්" සේවය කළ හැකි බව දක්වා ඇත. (2019.05.09 සාක්ෂි දෙමින්) සහ (2020.01.23 හරස් ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින්) 60 වන තුරු නොසිට සමහරු අස්වී ගිය බවත් 60 කලින් විශ්‍රාම නොගිය බවත් කියා සිටින ලදි. ඉල්ලුම්කරුට පමණක් නොව වෙනත් වැඩමූලිකයින්ට දී ඇති බව හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පැමිණිලිකරු කියා ඇත. A3, A4 ලේඛන කූඨ ලෙස මුදල් කළමනාකරු සමග ලබා ගත් බව විත්තියේ නීතිඥ මහතා යෝජනා කළ විට එය කිහිප විටක්ම තරයේ ප්‍රතික්ෂේප කර ඇත. කූඨ ලේඛන සකස්කළ බවට පොලිස් පැමිණිල්ලක් හෝ නෛතික ක්‍රියාමාර්ගයක් ගෙන නැත. වගඋත්තර පාර්ශ්වයේ නීතිඥ මහතා R 1 ලේඛනයේ 22 වන වගන්තියේ දක්වා තිබෙන විශ්‍රාම යන වයස A2 ලේඛනයෙන් වෙනසක් නොවූ බව යෝජනා කළත් ෆෝමන් ධූරයට පත්කළ විට වෙනත් පත්වීම් ලිපියක් නොදුන් බව පිළිගන්නා අතර අවු 55 විශ්‍රාම යන වයස 60 දක්වා සංශෝධනයක් ෆෝමන් ධූරයේ උසස්වීම් දීමේ ලිපියේ නැතත් සම්ප්‍රදායිකව සිදුවූ 60 දක්වා සේවය ලබා දෙන බව ටී.බී.එගොඩවත්ත සාක්ෂියට කැඳවා සනාථ කර ඇත. එසේම බැංකු සඳහා නිකුත් කළ ලිපි මගින්ද සනාථ වෙයි. A 4 (b) 2019.09.11 දින කම්කරු කොමසාරිස් නාරාහේන්පිට අමතා වාද්දුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව කළමණාකරු එවා ඇති ලිපිය ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත නිකුත් කර ඇත. එය මූලික සාක්ෂියේ ද ඉදිරිපත් නොකළ බැවින් වෙනත් අයෙකු මගින් ඉදිරිපත් කරන ලෙස දැන්වූවත් එය පිළිගත හැකි ලේඛනයක් වෙයි. එමෙන්ම A4 (b) ලිපිය කම්කරු කොමසාරිස් අමතා ජාතික ඉතිරිකිරීමේ බැංකුව එවා ඇති ලිපියක් නිසා එහි අන්තර්ගතය පිළිගැනීමට සිදුවෙයි. 2020.03.03 දින විභාගයේදී හරස් ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් ෆෝමන් වූ පසු පත්වීම් ලිපියක් නොදුන්නත් EPF වලට මුදල් යැවීම නවතා එම්.එස්.පී.එස්. (පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල) එකට මුදල් කපා යවනා බවත් නිවාඩු දවස් වෙළඳ නිවාඩු දිනවලට, ඉරිදා දිනවලදී අතිකාල දීමනා තුන්ගුණයකින් ගෙවා ඇති බවත් මේවා කොහේවත් සඳහන් නැතත් ඒ ආකාරයට සිදුවූ බවත් කිහිප විටකදීම ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ටී.බී.එගොඩවත්ත (2023.05.16) සාක්ෂි දෙන ලදී. A 12 ලේඛනය හා A 12 (a) ලේඛන ඔහු විශ්‍රාම ගන්වන ලද ලේඛන සහ වැටුප් පත්‍රිකා බව කියා සිටින ලදී. ආයතනයේ ප්‍රොඩක්ෂන් ෆෝමන් වරයෙකු විශ්‍රාම ගන්වන්නේ අනිවාර්යයෙන් අවුරුදු 60ක් බව සාක්ෂි දී ඇත. ඔහු හැර මෙහි සිටි වෙනත් ෆෝමන්වරු විශ්‍රාමගැන්වූයේද අවු 60 දී බව කියාසිටී. විත්තිය හරස් ප්‍රශ්න අසමින් A 12 හා A 12 (x) යන ලිපි මගින් වයස 60 වනතුරු විශේෂිත අවස්ථාවක් ලෙස පැවතුනේ කියා යෝජනා කළ විට සාක්ෂිකරු ප්‍රතික්ෂේප කර ඇත. සාක්ෂිකරු "ඒ වුනාට අපිට තියෙනවා පොදු ලිපියකින්. ඒ ලිපියේ සෑම ෆෝමන් කෙනෙක්ට ම 60 දක්වා සේවය කිරීමේ අයිතිය තිබෙනවා ඒක අපේ අයිතියක් ආයතනයට උදුරාගන්න බැහැ" යනුවෙන් සාක්ෂි දී ඇත. ආයතනයේ එවැනි පොදු ලිපියක් නැතැයි විත්තියෙන් යෝජනා කළ විට පිළිතුර වූයේ "සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා" යැයි සාක්ෂි දී ඇත. විත්තිය වෙනුවෙන් කමල් ජයතිලක සාක්ෂි දෙමින් ඔහු එම ආයතනයට සේවයට පැමිණෙන විට ඉල්ලුම්කරු නොසිටි බවත් ඔහුගේ පුද්ගලික ලිපිගොනුව බලා සාක්ෂි දෙන බව කියා ඇත. A3 ලේඛනය පෙන්වා ඉල්ලුම්කරුගේ නියෝජිත තැන කරන ලද හරස් ප්‍රශ්න වලදී කියා සිටියේ එම ලේඛනයේ අත්සන ආයතනයේ (Finance Manager) මුදල් කළමණාකාරිණිය ලෙස කටයුතු කළ අයකුගේ බවයි. " බැංකු ණය වලට අදාල ලිපි ඉල්ලා සිටීමට මානව සම්පත් අංශයෙන් පමණක් ලිපි ලබාදෙන බව සාක්ෂියේදී කියා ඇත." ඉල්ලුම්කරු ද තම සාක්ෂියේදී කියා සිටියේ එම කරුණම වෙයි. A3 ලේඛනයේ රබර් සීල් ලිපි ශීර්ෂය ආදිය ආයතනයේ බව පිළිගනී. මුදල් කළමනාකාරිණියගේ අත්සන ද කියා නොදන්නා බවත්, ඇය දැක නැති බවත් කියාසිටී නමුත් ඇය අත්සන් කර ඇති බව පිළිගනී. A12 පෙන්වා හරස් ප්‍රශ්න ඇසීමේදී ලේඛන අනුව එගොඩවත්ත යන අයව අවු 60න් විශ්‍රාම ගන්වන ලද බව පිළිගනී.

කෙසේ වෙතත් විත්තියේ එකම සාක්ෂිකරු වන කමල් ජයතිලක මෙම ආයතනයට පැමිණ ඇත්තේ ඉල්ලුම්කරු විශ්‍රාම ගැන්වූ පසු බැවින් සහ ඔහුගේ සාක්ෂි පුද්ගලික ලිපිගොනුව දුන් බැවින් ආයතනයේ සංවිධායක පසුබිම නොදැන සාක්ෂි දීම මත එම සාක්ෂිය ඉල්ලුම්කරුට විරුද්ධව කරුණු තහවුරු කිරීමට ප්‍රමාණවත් ද යන සැකය මතුවෙයි. ආයතනය සතු වන ලේඛන ඉදිරිපත් කිරීමට හෝ නොකිරීමට ආයතනයේ ඉහල කළමනාකරණ තීරණ මත සිදුවන බැවින් සාක්ෂිකරුගේ සාක්ෂිය සැකයට භාජනය වෙයි.

මියගිය ඉල්ලුම්කරුවාගේ අයිතිවාසිකම් ඔහුගේ මරණින් පසු හිමිකම් පැවරිය හැකි නම් ආදේශ කිරීම කළ හැකි බව විනිශ්චිත නඩු තීන්දු වලින් පෙන්වා දී ඇත. මෙම ඉල්ලුම්කරු මියගොස් ඇතිවිට නැවත සේවයේ පිහිටුවීමට නියෝගයක් ලබාදිය නොහැකි බැවින් විකල්ප ලෙස වන්දියක් ලබා දීමට සිදුවේ. ඉල්ලුම්කරු මිය යාමත් සමග ඔහුගේ අයිතිවාසිකම් යටපත් වන්නේද නැත. ඉල්ලුම්කරු ඉල්ලුම්පත ඉදිරිපත් කර ඇත්තේ ආයතනය විශ්‍රාම ලිපිය නිකුත් කළ විට විශ්‍රාම යාමට පෙර හා මියයාමට පෙර තමාට ඇති අයිතිවාසිකම් ලේඛන සහ සාක්ෂි මගින් සනාථ කර ඇත. එහෙත් ඔහු අවු 60 දක්වා ජීවත්නොවී අවු 04ක් හා එක් මසක් ජීවත්ව සිට ඇති බැවින් මාස 60ක කාලයට මූල්‍ය පාඩුවක් වී ඇත යන මතයට එකඟ විය නොහැකිය.

ඉහත සඳහන් කළ කරුණු සාක්ෂි ලේඛන, කරන ලද ප්‍රශ්න කිරීම් වලදී හෙලිවන කරුණු සහ වැටුප් ගෙවීම් දීමනා අතිකාල ගෙවීමේදී හා උසස් වීමක් ලබා දී නව පත්වීම් ලිපි නොදී නීත්‍යානුකුල අපේක්ෂා ඇති කර තිබීම සලකා බැලීමේදී අවු 60 වන තෙක් එම ආයතනයේ සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පෙනී යන බැවින් ඉල්ලුම්කරු ජීවත්ව සිටියේ නම් මසකට රු. 38966.00ක මූලික වැටුපකට හිමිකම් තිබූ බැවින් එම මුදල මාස 49ක කාලයට පමණක් වැටුප ලෙස රු. 1909334.00 (රුපියල් දහනව ලක්ෂ නවදහස් තුන්සිය තිස් හතර) ක මුදලක් ඉල්ලුම්කරුගේ විවාහක බිරිඳට ලබාදීමට නියම කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර මාසයක් ඇතුළත අදාළ පාර්ශ්වයට ලබාගත හැකි පරිදි මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන මෙන් මෙහි දෙවන පාර්ශ්වය වන ඇක්මී ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජිං පී.එල්.සී. වෙත නියම කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්.එස්.ආරියප්පෙරුම,
බේරුම්කරු.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
බේරුම්කරණ අංශයේ දී ය.

EOG 12 - 0003